7018

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය - 2014

## (05) විගණනය හා විමර්ශනය

පැ. තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** (i) අභ්‍යන්තර විගණනය (Internal Audit) හා අභ්‍යන්තර පරීක්ෂාව (Internal Check) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(ii) බාහිර විගණක විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි, අභ්‍යන්තර විගණක විසින් ඉටු කරනු ලබන කාර්යයන් **පහක්** සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

**2.** 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇති විගණන ප්‍රමිතිවල දැක්වෙන පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

(i) ප්‍රමාණාත්මකභාවය හා විගණන අවදානම (Materiality and Audit Risk) අතර ඇති සම්බන්ධය *(ලකුණු 06 යි)*

(ii) ගිණුම්කරණයට අදාළ අභ්‍යන්තර පාලනවලින් අපේක්ෂිත අරමුණු (Internal Controls Related to Accounts) *(ලකුණු 08 යි)*

(iii) අභ්‍යන්තර පාලනවල ආවේණික සීමා (Inherent Limitations in Internal Controls) *(ලකුණු 06 යි)*

**3.** (i) රාජ්‍ය ආයතනවල විගණනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිගේ කාර්යභාරය සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

(ii) එම කාර්යභාරය ඉටුකිරීම සඳහා ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිතුමාට ලබා දී ඇති අයිතිවාසිකම් කවරේ ද? *(ලකුණු 10 යි)*

**4.** විගණනය සඳහා ඔබ වෙත ලැබී ඇති වර්ෂ අවසාන ගිණුම් ප්‍රකාශවල දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඔබ සත්‍යාපනය / සන්නිරීක්ෂණය කරන්නේ කෙසේ ද?

(i) ස්ථාවර වත්කම් සඳහා ගණනය කර ඇති ක්ෂය ප්‍රතිපාදන
(ii) සේවක වැටුප්
(iii) බැංකු අයිරාව
(iv) අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය
(v) දීර්ඝ කාලීන ආයෝජන

*(ලකුණු 20 යි)*

**5.** කෙටි සටහන් ලියන්න.

(i) විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි (Analytical Procedures)
(ii) 1971 අංක 38 දරන මුදල් පනත (Financial Act No.38 of 1971)
(iii) අභ්‍යන්තර පාලන ප්‍රශ්නාවලිය (Internal Control Questionnaire)
(iv) කාර්ය සාධන විගණනය (Performance Audit)
(v) විගණනය හා විමර්ශනය (Audit and Investigation)

*(ලකුණු 20 යි)*

* * *